# 1. නමදිමු මුනිඳාණන්



සොත් සිරි දෙන මහ ගුණ මුහුදාණන්
සත්හට වන බව දුකට වෙදාණන්
තිත් ගණඳුරු දුරලන දිනිඳාණන්
සිත් සතොසින් නමදිමි මුනිඳාණන්



2. ර. මු. නී. ශ. 120272

# 2. අපි දහම් පාසල් යමු

කීචි ....... බීචි ..........
කීචි ....... බීචි ..........

ලස්සන කුරුලු ගීතයක් ඇහුණා.
චමරි ජනෙල් කවුළුව දිහා බැලුවා.
චටින් පිටින් එළිය වැටීගෙන එනවා.
චමරිට හරි සතුටුයි.
අද දහම් පාසල් යන දවස.
චමරි ඉක්මනින් මුහුණ සෝදා
උදේ ආහාර ගත්තා.



මිදුල පුරා හැම ගහක ම
පාට පාට මල් පිපිලා.



වතුසුදු ගහේ සුදු පාට මල්,
කටරොළු වැලේ නිල් පාට මල්
දාස්පෙති, අටපෙති,
ඉද්ද, පිච්ච හැම ගහක් ම
මල්වලින් පිරිලා.

චමරි සීරුවෙන් මල් නෙළුවා.
ලස්සන ලස්සන සුවඳ මල්වලින්
වට්ටිය පිරුණා.



චමරි අම්මාටත් වැන්ද.
තාත්තාටත් වැන්දා.
'මගේ දුවට සම්මා
සම්බුදු සරණයි''
අම්මාත් තාත්තාත්
පුංචි චමරිට
ආශිර්වාද කළා.

චමරි පාර දිහා බැලුවා.
පාරපුරා ම ලස්සන මල් පෙරහැරක්
යනවා වගෙයි.



නයනා, අමර,
නීලා, මාලා,
කුමුදු, සුමුදු,
නිමල්, විමල්
පාට පාට
මල් අරගෙන
පිරිසිදු ඇඳුම් ඇඳගෙන
සන්සුන් ගමනින්
දහම් පාසල වෙත යනවා.
හැම දෙනාගේ ම මුහුණු
සතුටින් පිරිලා.

චමරිත් යහළුවන්ට එකතු වුණා.

**"ස්වාමීන් වහන්සේලා ඇසුරු කිරීම උතුම් මංගල කරුණකි." බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම්


1. දහම් පාසල් යාමට පෙර චමරි කළ දේවල් පිළිවෙළින් ලියන්න.
2. චමරිගේ යහළුවන් දහම් පාසල් ගියේ කෙසේ ද?
3. ඔබත් දහම් පාසල් යාමට උනන්දු වන්න.

# 3. දුමිඳුගේ උපන් දිනය

දුමිඳු උදෙන් ම අවදි වුණා. අවටින් කුරුලු ගීත ඇහෙනවා. ගස්වැල්වල මල් පිපිලා. අවට හරි ම සුවඳයි. ලස්සන දවසක්!




'අද පුතාගේ උපන් දිනේ.'' අම්මා කිව්වා. ''අපි අද හවස පන්සල් යමු. මල් පහන් පූජාවක් කරමු.'' තාත්තා කිව්වා. දුමිඳුට හරි ම සතුටුයි. හවස් වන විට උඩහ ගෙදර ලොකු මාමා නෙළුම් මල් අරගෙන ආවා. පහළ ගෙදර ආච්චී පාට පාට කොඩි වැලක් ගෙනාවා. දුමිඳුගේ අක්කා ගැටපිච්ච මල්වලින් මල් මාලයක් හැදුවා.



ගිලන් පස බුද්ධ පූජාව සකස් කර ගෙන සියලු දෙනා ම පන්සල් ගියා.මේ ගමනට දුමිඳුගේ යහළුවොත් එකතු වුණා. සියලු දෙනා මළුව ඇමදුවා.



පහන් පත්තු කළා. මල්මාලාව බෝධීන් වහන්සේට පැළඳුවා. කොඩි වැලත් එල්ලුවා.කොඩි වැලේ නිල් කහ රතු සුදු මදටිය පාට කොඩි බෝපත් සමඟ සුළඟේ සැලුණා. හරි ම ලස්සනයි. අපේ පන්සලේ හාමුදුරුවෝ වැඩියා.''ස්වාමීන් වහන්ස, අද පුතාගෙ උපන් දිනය'' පිංකමට හේතුව තාත්තා කිව්වා.



ස්වාමීන් වහන්සේ සියලු දෙනා ම පන්සිල්හි පිහිටෙව්වා. ගාථා කියෙව්වා. සෙත් පිරිත් දේශනා කළා.

ස්වාමීන් වහන්සේ
අනුශාසනාවක් ද කළා.

"අද මේ පින්වතුන් කළේ
කාටත් ආදර්ශවත්
යහපත් පින්කමක්.
තමන්ගේ
උපන් දිනය
හැම කෙනකුට ම
ඉතා ම වැදගත්
දවසක්. මෙවැනි
වැදගත් දවසක දී
පන්සලට ඇවිත්
තෙරුවන් වැඳ
පුදා ගෙන
පින්සිදු කර ගැනීම
හොඳ සිරිතක්."



"බුදු සරණ වේවා
සදහම් සරණ වේවා
සඟ සරණ වේවා
මෙතුන් සරණින් ජය ම වේවා !

පැවරුම්
1. දුමිඳුගේ උපන් දින පින්කම චිත්‍රයට නගන්න.
2. තම උපන් දිනය වෙනුවෙන් මල් පහන් පූජා පින්කමක යෙදීම පුරුද්දක් කර ගන්න. පින්කම කළ ආකාරය පන්තිය ඉදිරියේ කියන්න.

# 4. ශිල්ප උගනී කුමරු සොඳවා

සිද්ධාර්ථ කුමාරයාගේ පියා සුද්ධෝදන රජතුමා. "හොඳ ගුරුවරයකු ගෙන්වා සිද්ධාර්ථ කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර උගන්වන්න ඕනෑ," රජතුමා ඇමති මණ්ඩලයට කිව්වා.

"රජතුමනි, කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර උගන්වන්න හොඳ ම ගුරුතුමා සර්වමිත්‍ර බමුණු පඬිතුමායි. එතුමා කඩු ශිල්ප, දුනු ශිල්ප, යුද්ධ ශිල්ප ආදී රාජ කුමාරයකුට අවශ්‍ය සියලු ම දේවල් ඉතා ම හොඳින් උගන්වන බව ප්‍රසිද්ධයි." ඇමතිවරු කිව්වා.



සුද්ධෝදන රජතුමා සර්වමිත්‍ර පඬිතුමා
රජ මාලිගාවට කැඳෙව්වා.
රාජ්‍ය ගෞරවය ඇතිව එතුමා පිළිගත්තා.
ඉතා ම හොඳින් සංග්‍රහ කළා.

"ඇදුරුතුමනි,
ඔබතුමාට මෙහි
පැමිණෙන ලෙස ආරාධනා
කළේ මගේ පුත් කුමරුගේ
ඇදුරු තනතුරට පත්කර
ගැනීමටයි. කරුණාකර
එය භාරගනු මැනවි."
රජතුමා කිව්වා.
එතුමා ඉතා ම කැමැත්තෙන්
එම තනතුර භාර ගත්තා.

සිද්ධාර්ථ කුමාරයා ගුරුතුමාට හරි කීකරුයි.
ගුරුතුමා දෙන අවවාද ඉතා ම හොඳින්
පිළිපදිනවා.
එතුමා උගන්වන හැම දෙයක් ම
කුමරුට බොහොම හොඳින්
මතක හිටිනවා.
සර්වමිත්‍ර පඬිතුමාට හරි පුදුමයි.
පඬිතුමා ද
සිද්ධාර්ථ කුමාරයාට හුඟාක් ආදරෙයි.



3. ශ්‍ර. මු. නී. ස. 120272

"රජතුමනි,
සිද්ධාර්ථ කුමාරයාට
මා දන්නා ශිල්ප ශාස්ත්‍ර
සියල්ල ම උගන්වා අවසානයි,"
සර්වමිත්‍ර බමුණු පඬිතුමා
සුද්ධෝදන රජතුමාට කිව්වා.

"මේ තරම් ඉක්මනට?"
"එහෙමයි රජතුමනි,
ඔබේ පුත් කුමරා හරි ම දක්ෂයි.
ඒ නිසා ම කුමාරයා හැම දෙයක් ම
හොඳින් තේරුම් ගන්නවා."
ගුරුතුමා සිද්ධාර්ථ කුමාරයාගේ
හිස අතගාමින් කිව්වා.
සුද්ධෝදන රජතුමා
ඉතාමත් සතුටට පත් වුණා.

පැවරුම්

1. ඉගෙන ගන්නා කාලයේ දී සිද්ධාර්ථ කුමාරයා තුළ තිබූ ගුණාංග ලියන්න.
2. සිද්ධාර්ථ කුමාරයා මෙන් හොඳින් ඉගෙනීමට උනන්දු වන්න.

# 5. හිංසාවට අකැමැති කුමාරයා

සිදුහත් කුමාරයා කුඩා කාලයේ
යාළුවොත් එක්ක
සෙල්ලම් කළා.
දේවදත්ත, නන්ද, කාළුදායි, ඡන්න
යන කුමාරවරු
නිතර ම සෙල්ලම් කිරීමට එකතු වුණා.
එක් දවසක්
රාජ කුමාරවරු කිහිප දෙනෙක්
සිදුහත් කුමරු කැඳවා ගෙන
සෙල්ලම් පිටියට ගියා.
පිටියට එහායින් තිබුණේ කැලෑවක්.
එහි සිටි හාවුන් මුවන් දැක
හැමෝ ම සතුටු වුණා.
සමහර කුමාරවරු
මුවන් පස්සේ
එලවා ගොස්
හිරිහැර කළා.



"අනේ මේ අසරණ සතුන්ට
මෙහෙම හිරිහැර කරන්නේ ඇයි?
කැලේ හැදෙන දේවල් කාලා
ජීවත් වන මේ අසරණ සතුන්ට
හිංසා කරන්න මම කැමති නැහැ,"
කියා සිදුහත් කුමාරයා ආපසු ආවා.
නැවත එවැනි යහළුවන් සමඟ
සෙල්ලමට ගියේ නැහැ.


පැවරුම්

1. සමහර කුමාරවරු කළ, සිදුහත් කුමාරයා අකැමැති දේ කුමක් දැයි ලියන්න.
2. තම ගෙදර දීත් පාසලේ දීත් සතුන්ට ආහාර දීමේ හොඳ පුරුද්දක් ඇති කර ගන්න.

# 6. මට්ටකුණ්ඩලී

ඉස්සර පුංචි මට්ටකුණ්ඩලී නම් කුමාරයෙක් හිටියා. දිනක් මේ කුමාරයා තදින් ම අසනීප වුණා. මට්ටකුණ්ඩලීගේ තාත්තාගේ නම අදින්න පුබ්බක. ඔහු බොහෝ ම ලෝබ කෙනෙක්. තම පුතාගේ අසනීපයට වෙදමහතකු ගෙන්වා බෙහෙත් කළේ නෑ. මිල මුදල් වියදම් වනවාට ලෝභ නිසා ගෙදර දී ම පුළු පුළු අත් බෙහෙත් කළා. ඒවායින් කුමාරයාගේ අසනීපය යන්තම්වත් අඩු වුණේ නෑ.





ටික දවසකින් අසරණ මට්ටකුණ්ඩලීට හොඳට ම අමාරු වුණා. ඔහුට වේදනාව ඉවසන්න බැරි තරමට අසනීපය වැඩි වුණා. අනේ! හරියට බේතක් නොලැබුණු මට්ටකුණ්ඩලී දැන් මිය යාමට ආසන්නයි. අදින්න පුබ්බක බමුණා මෙහෙම හිතුවා. "ගේ ඇතුළේ පුතා මැරුණොත් බලන්න එන අය මගේ බඩු මුට්ටු රන් රිදී පෙට්ටගම් දකීවි. ඊළහට හොර හතුරෝ අපට කරදර කරාවි." බමුණා මට්ටකුණ්ඩලී ඔසවා ගෙන ගොස් පිලෙහි තැබුවා.

මට්ටකුණ්ඩලී තව මොහොතකින් මිය යන බව බුදුහාමුදුරුවෝ දැක්කා. ඒ වෙලේ ම බුදුහාමුදුරුවෝ ඔහුගේ නිවසේ මිදුලට වැඩම කළා. මට්ටකුණ්ඩලී බිත්තියට වැටුණු බුදුරැස් මාලාව දැක හැරී බැලුවා. බුදුරජාණන් වහන්සේ දුටු මට්ටකුණ්ඩලීගේ සිතට විශාල සතුටක් ඇති වුණා. වේදනාව අමතක වුණා. හිත සතුටින් දෑත් එක්කර



සාධු! සාධු!! කියා බුදුරජාණන් වහන්සේට වැන්දා. මට්ටකුණ්ඩලී එවෙලේ ම මිය ගියා.

හිත සතුටින් වැන්ද පිනෙන් මට්ටකුණ්ඩලී කුමාරයා දෙව් ලොව උපන්නා.

**"තමා කළ පින සෙවනැල්ල මෙන් තමා සමග පැමිණේ" බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම

1. මේ කතාවෙන් හෙළිවන බුදුරජාණන් වහන්සේගේ හොඳ ගුණය කුමක් ද?
2. මට්ටකුණ්ඩලී දිව්‍ය ලෝකේ උපන්නේ කුමන පිනකින් ද?
3. තම නිවසේ දී දිනපතා සවස බුද්ධ වන්දනාවේ යෙදීම පුරුද්දක් කර ගන්න.

# 7. කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවෝ


කුමාර කාශ්‍යප කුඩා දරුවෙක්. අවුරුදු හතේ දී මේ දරුවා බුදුහාමුදුරුවන් ළඟ මහණ වුණා.

මේ කාලයේ බොහෝ අය බුදුහාමුදුරුවන් හමුවීමට එනවා. නොයෙක් රස කැවිලි පලතුරු ආදිය පූජා කරනවා. දවසක් බුදුහාමුදුරුවෝ හාමුදුරු නමකට කතා කළා.

"මේ පලතුරුවලින් ටිකක් කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන්ට ගෙනිහින් දෙන්න."




පොඩි හාමුදුරුවන්ට මෙසේ පලතුරු රස කැවිලි යවන එක බුදුහාමුදුරුවන්ගෙ සිරිතක්.



කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවොත් බුදු හාමුදුරුවන්ගේ පන්සලෙන් හාමුදුරු නමක් වඩින තුරු මඟ බලා ගෙන ඉන්නවා.

මේ පොඩි හාමුදුරුවෝ බුදුහාමුදුරුවන්ගේ අවවාද හොඳින් පිළිපැද්දා. ඒ නිසා ම උන්වහන්සේ කුඩා කාලයේ ම රහත් වුණා.

කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ හොඳින් බණ කියන්න දක්ෂයි. මේ නිසා හොඳින් බණ කියන්න දන්නා හාමුදුරුවරුන් අතරින් අගතනතුරට ද පත් වුණා. බුදුහාමුදුරුවෝ අපි වගේ පොඩි දරුවන්ට හරි කරුණාවයි.



**"පොඩි හාමුදුරු නමකට වුව ද ගරු කළ යුතු ය.**
**අවමන් කිරීම හොඳ නැහැ"**
**බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම


1. මෙම පාඩමෙන් කියවෙන බුදුහාමුදුරුවන්ගේ සිරිතක් ලියන්න.
2. කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේට ලැබුණු අගතනතුර කුමක් ද?

# 8. පින්තාලිය

එදා පාසලේ සිල් සමාදන් වූ දවසයි. ධර්ම දේශනාවට වැඩම කළ ස්වාමීන් වහන්සේ සිල් ගත් දරුවන්ට හොඳ බණ කතාවක් කියා දුන්නා.



දවසක් බුදුහාමුදුරුවන් වැඩ සිටි
ජේතවන විහාරයට
දේවතාවෙක් ආවා.
"ස්වාමීනි, රෑ දාවල්
දෙකෙහි ම
පින් සිදුවන යහපත්
වැඩ තිබෙනවා ද?"
දේවතාවා
බුදුහාමුදුරුවන්ගෙන් ඇසුවා.



"ඔව්, එවැනි පිංකම් හුඟාක් තිබෙනවා"
බුදුහාමුදුරුවෝ පිළිතුරු දුන්නා.
"ස්වාමීනි, ඒ පින්කම් මොනවා ද?
මම ඒවා දැනගන්න කැමතියි,"
දේවතාවා කිව්වා.
"මල් උයන් සකස් කිරීම,
ගස්වැල් වැවීම, ඒදඬු පාලම්
තැනීම, පැන් බීමට
පින්තාලි තැබීම ආදිය
දිවා රෑ පින් වැඩෙන වැඩ කටයුතු,"
බුදුහාමුදුරුවෝ දේවතාවාට පැවසුවා.

''ස්වාමීන් වහන්ස, මල් උයන් වවන එකත් පින්තාලි තබන එකත් පින් ලැබෙන වැඩද?'' පියුමි ඇසුවා.

''ඔය දරුවා ඇහුවේ හොඳ ප්‍රශ්නයක්. ප්‍රශ්න අහල කරුණු දැන ගැනීම ඉගෙන ගන්න දරුවන්ගෙ හොඳ ගතියක්. මල් උයන් වැවීම, පින්තාලි තැබීම දිවා රෑ දෙකේ ම පින් වැඩෙන උතුම් පින්කම්'' හාමුදුරුවෝ කරුණාවෙන් කියා දුන්නා.



''අපිත් කුරුල්ලන්ට වතුර තියන්න පින්තාලියක් හදමු''

සිල් සමාදන් ව සිටි පියුමි, සුමුදු සහ අමර කතා කර ගන්නා.


පැවරුම්

1. බුදුහාමුදුරුවෝ දේවතාවාට පැවසූ දිවා රෑ පින්සිදු වන වැඩ මොනවා දැයි ලියන්න.
2. කුරුල්ලන් සඳහා පාසලේ පන්තිය ළඟ පින්තාලියක් තබන්න. එයින් වතුර බී නාමින් සතුටු වන කුරුල්ලන් දෙස බලා සිට පන්තියේ සියලු දෙනා ම සමඟ සතුටු වන්න.

# 9. හොඳ සිරිත්

දවසක් කොසොල් මහරජතුමා දීඝකාරායන ඇමති සමඟ ගමනක් ගියා. අතරමග දී බොහෝ ම ලස්සන ගමක් හමු වුණා. මේ ගමේ බැලූ බැලූ අත තිබුණේ සරුසාර කෙත් වතු සහ මල් උයන්.

"මෙහෙම තැනක දී බුදුහාමුදුරුවන් හමුවන්න ඇත්නම් මොන තරම් හොඳ ද?" රජතුමාට සිතුණා.



කොසොල් රජතුමා දීඝකාරායන ඇමති සමග තවත් ඉදිරියට ගියා. නිසංසල උයනක පොඩි හාමුදුරුවරු භාවනා කරමින් සිටියා. රජතුමා පොඩි හාමුදුරුවරුන් ළඟට ගියා. "ස්වාමීන් වහන්ස, මට බුදු හාමුදුරුවන් හමු වන්න පුළුවන්ද?" රජතුමා ගෞරවයෙන් ඇසුවා.

"අර ඈත පේන කුටියේ බුදුහාමුදුරුවෝ වැඩ සිටිනවා. කුටිය ළඟට ගිහින් උගුර පාදා එක් වරක් දොරට තට්ටු කරන්න. එවිට උන්වහන්සේ ඔබට කතා කරාවි." පොඩි හාමුදුරුවරු කරුණාවෙන් පැවසුවා.

"මේ පරිසරය මොන තරම් නිසංසල ද?
පොඩි හාමුදුරුවරුන්ගේ ගමන බිමන කොතරම් සංවර ද? අඩි ශබ්දයක් පවා නැහැ. සමහර දවස්වලට මගේ රාජ සභාවේ වැඩ හරි ම අවුල්. පොඩි ප්‍රශ්නයක් විසඳන්න ගියත් එතන මහා ඝෝෂාවක්. එවිට කිසි ම වැඩක් හරියාකාර ව කරන්න බැහැ."

රජතුමා මෙසේ සිතමින් බුදුහාමුදුරුවන් වැඩ සිටි කුටිය වෙතට ගියා. පොඩි හාමුදුරුවරුන් කිවූ පරිදි තමා පැමිණි බව බුදුහාමුදුරුවන්ට දැන ගන්න සැලැස්සුවා. බුදුහාමුදුරුවෝ කොසොල් මහරජතුමාට කතා කළා.



කොසොල් මහරජතුමා නළල්පට සහ
ඉණ රැඳි කඩුව, දීඝකාරායන
ඇමති අතට දුන්නා. මිරිවැඩි සහල
ගලවා පසෙකින් තැබුවා. ඉතා ම
සන්සුන් ව බුදුහාමුදුරුවන් වැඩ සිටි
කුටිය ඇතුළට ගියා.
"රජතුමා බුදුහාමුදුරුවන් සමඟ කතා කරන
තැනට මා යන එක හොඳ නැහැ."
දීඝකාරායන ඇමති සිතුවා.
රජතුමාට බුදුහාමුදුරුවන් සමඟ නිදහසේ
කතා කරන්නට ඉඩ දී පිටතට වී
සිටියා.

පැවරුම්


1. නිවැරදි පිළිතුරු තෝරා ලියන්න.
   - i. කොසොල් රජතුමා ගමන ගියේ ............. සමඟ ය.
     (ජන්ත ඇමති, දීඝකාරායන ඇමති)
   - ii. පොඩි හාමුදුරුවරුන් සිටියේ ............. ය.
     (භාවනා කරමින්, සක්මන් කරමින්)
   - iii. පොඩි හාමුදුරුවරුන් කොසොල් රජතුමාට කීවේ ......ය.
     (උගුර පාදා වරක් දොරට තට්ටු කරන්න, උගුර පාදා දොර ඇරගෙන ඇතුළට යන්න)
   - iv. කොසොල් රජතුමා බුදුහාමුදුරුවන් වැඩ සිටි කුටිය ඇතුළට ගියේ නළල් පට හා කඩුව .......... ය.
     (සහිත ව, නැති ව)
2. මෙම පාඩමෙන් ඉගෙන ගත හැකි හොඳ පුරුදු ලියන්න.

# 10. කලගුණ සැලකූ බුදුපියාණන් වහන්සේ

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි
ආරාමය අසල ගමක මිනිසුන් අතර
දරුණු බෝවෙන රෝගයක් පැතිරුණා.
අහිවාතක රෝගය නමැති මේ අසනීපය
වැළඳෙන හැම දෙනා ම දින කිහිපයකින් මිය යනවා.

මේ ගමේ එක ගෙදරක
කුඩා ළමයි දෙන්නෙක් හිටියා.
ඒ අයගේ අම්මාටයි තාත්තාටයි
අහිවාතක රෝගය
බෝවුණා. ටික දිනකින්
අම්මාත් තාත්තාත් මිය ගියා.
දරුවන් දෙදෙනා
තනි වුණා.

"අපේ ගෙවල්වලට
නම් එන්න එපා.
අපටත් අසනීපය
බෝවේවි !"
නෑදැයෝත්
අසල්වැසියෝත්
දරුවන් දෙදෙනා
එළවා ගත්තා.



පිඬු සිඟා වඩිමින් සිටි ආනන්ද හාමුදුරුවෝ
අසරණ දරුවන් දෙදෙනා දැක්කා.
ආනන්ද හාමුදුරුවෝ මේ දරුවන් දෙදෙනා
බුදුරජාණන් වහන්සේ ළඟට කැඳවා ගෙන ගියා.

"මෙම දරුවන්ගේ දෙමාපියන් ජීවත් ව සිටිද්දී
නිතර අපට දන් දුන්නා;
උපස්ථාන කළා.
ඒ අය අපට කළ උපකාරවලට
අප කළගුණ සැලකිය යුතුයි.
මේ දරුවන් දෙදෙනා පැවිදි කරවන්න,"
බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට පැවසුවා.



"කළගුණ සැලකීම උතුම් මිනිස් ගුණයකි.
බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

පැවරුම්

1. අසරණ වූ දරුවන් දෙදෙනාට බුදුහාමුදුරුවන් පිහිට වූයේ කෙසේ දැයි ලියන්න.
2. ඔබ අනෙක් අයට කරන උදවු ඔබේ හොඳ වැඩ පොතෙහි ලියන්න.


# 11. කුලාවක ජාතකය

ඉස්සර කාලයේ පොහොසත් ගෙදරක මඝ නම් තරුණ කුමාරයෙක් හිටියා. ඔහු පන්සිල් රකින දන් දෙන හොඳ කෙනෙක්. මොහු සිටි ගමේ ගෙවල් තිහක් තිබුණා. දවසක් සියලු ම ගෙවල්වලින් තරුණයකු බැගින් ගම් මැද්දට රැස් වුණා.

මඝ කුමාරයා ඒ ගම මැද එක් තැනක් සිත් ගන්නා ලෙස පිරිසිදු කළා.

"මෙතැන මට හොඳයි," එතැන සිටි කෙනෙක් කිව්වා. ඒ ස්ථානය ඔහුට දී මඝ කුමාරයා වෙනත් තැනක් ශුද්ධ කර ගත්තා.

"මෙතැන මට හොඳයි," තවත් කෙනෙක් කිව්වා. මෙලෙස මඝ කුමාරයා සකස් කළ තැන් එක එක්කෙනාට දුන්නා. මඝ කුමාරයා අවසානයේ සකස් කළ තැන මණ්ඩපයක්, ශාලාවක් සහ පැන් පොකුණක් සෑදුවා.



මේ නිසා තරුණයෝ තිස් දෙනා ම මඝ කුමාරයාට පැහැදුණා.
මඝ කුමාරයා මේ අයට පන්සිල්
රැකීමේ අගය කියා දුන්නා.
ඒ අයත් පන්සිල් රකින්න
පටන් ගත්තා.
සියලු දෙනා ම
එකතු වී පාරවල්
හදනවා.
ඒදඬු දමනවා,
පොකුණු හදනවා.
දැන් ගම
හරි ම ලස්සනයි.




ගමේ ප්‍රධානියා
දවසක් මෙහෙම හිතුවා.
"ඉස්සර මේ ගමේ මිනිස්සු සතුන් මරා මස් කනවා.
සුරා විකුණනවා. ඒවායින් මට හොඳ වාසි ලැබුණා.
දැන් ඒ වාසි කිසිවක් ලැබෙන්නේ නැහැ.
මමත් කරන්නම් හොඳ වැඩක්," කියා
ඔහු රජතුමා ළඟට ගියා.
"ස්වාමීනි, හොරු කණ්ඩායමක් ගම වනසනවා"යි
රජුට කිව්වා. රජතුමා කිසිවක් සොයා බැලුවේ නැහැ.
සොරුන් අල්ලා ගෙන එන ලෙස රාජපුරුෂයන්ට අණ කළා.

"මේ හොරුන් ඇතුන් ලවා පාගවා මරා දමනු,"
රජ නියෝග කළා.

රාජපුරුෂයෝ මේ පිරිස බිම හාන්සි කෙරෙව්වා.

"අපි පන්සිල් රකින අය.
හැමෝම තමන් කරපු
හොඳ වැඩ සිහි
කරගන්න.
ගමේ නායකයාටත්,
රජතුමාටත්, අප
පාගා දමන්නට එන
ඇතුන්ටත් මෙත් වඩන ලෙස
මඝ කුමාරයා පිරිසට කීවා.



එක ඇතෙක් පිරිසට ළං වුණා.
ඒ ඇතා මහ හඬ දෙමින් හැරී දිව්වා. පිරිස පාගා දමන්නට
එවූ සියලු ම ඇත්තු මෙසේ ආපසු හැරී දිව්වා.

"මේ අය ළඟ ඇතුන් පන්නා
දමන බෙහෙතක් ඇති. සොයා බලනු,"
රජ අණ කළා.



එසේ බෙහෙතක් තිබේ
දැයි රාජපුරුෂයෝ
සොයා බැලුවා.
"නැහැ ස්වාමීනි, එහෙම
බෙහෙතක් ඔවුන් ළඟ
නැහැ." රාජපුරුෂයෝ
කිව්වා.

"ඔබ ළඟ ඇතුන් එලවන
මන්ත්‍රයක් තිබෙනවා ද?"
රජතුමා මඝ කුමාරයාගෙන්
ඇසුවා.

'රජතුමනි,
අපි පන්සිල් රකින අය.
ගම් බිම් හදන අය.
මෙත් වඩන අය.
ඒ තමයි අප ළඟ තිබෙන
මන්ත්‍රය,' මඝ කුමාරයා
කිව්වා.

රජතුමා සතුටු වුණා.
ගමේ කටයුතු
මඝ කුමාරයා
ඇතුළු පිරිසට පැවරුවා.



**'සිල් සුවඳ මල් සුවඳට වඩා උසස් ය'**
**බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම්
1. මඝ කුමාරයා තුළ තිබුණු හොඳ ගුණ ලියන්න.
2. කුමාරවරුන් තිස් දෙනා පැඟීමට පැමිණි ඇතුන් ආපසු යාමට හේතුව ලියන්න.
3. දිනපතා මෙත් වැඩීම පුරුද්දක් කර ගන්න.

# 12. රුවන්වැලි මහා සෑය



පොසොන් පොහොය දා
අමරත් අම්මාත්
අනුරාධපුරයේ වන්දනාවේ ගියා.
ගමන් මහන්සිය නිසා අමර ඉක්මනින් ම
නින්දට වැටුණා. නින්දේ සිටි අමර ලස්සන සිහිනයක් දුටුවා.

"දුටුගැමුණු මහ රජතුමා මාලිගයට එමින් සිටියා.
අතරමග දී ගල්ටැඹක් ළඟ නැවතුණා.
'දුටුගැමුණු නම් රජ කෙනෙක් මේ ස්ථානයේ
මහා වෙහෙරක් කරනවා', ගල්ටැඹේ ලියා තිබුණා.
මෙම වචන කියවූ රජතුමා සතුටෙන් සිනාසුණා.

ගල්ටැඹ ළඟ ම රන් තෙලඹු ගසක් තිබුණා. ස්වර්ණමාලී දෙව්දුව මේ ගසේ වැඩ සිටිනවා.

"මෙතැන බුදුහාමුදුරුවන් වෙනුවෙන් වෙහෙර වහන්සේ නමක් හදන්නට වෙන් වූ තැනක්. ඔබට වෙනත් විමානයක් හොයා ගන්න පුළුවන් නම් හොඳයි," රජතුමා දෙව්දුවට කිව්වා.



"වෙහෙරක් හදනවා නම් මම වෙනත් විමානයක් සොයා ගන්නම්. ඔබ හදන වෙහෙර වහන්සේට මගේ නම තියන්න," ස්වර්ණමාලි දෙව්දුව ඉල්ලා සිටියා.

රජතුමා එයට කැමති වුණා. වෙහෙර වහන්සේට මුල් ගල තබන්න මහා උත්සවයක්. රහතන් වහන්සේලා දෙවිවරු සහ මහ සෙනඟ රැස් වෙලා. සාධු නාද මැද රජතුමා මුල් ගල තැබුවා.

තවත් මහා උත්සවයක්. මහ රහතන් වහන්සේලා රැස් වෙලා. දෙවිවරු අහසේ සිට සාධුකාර දෙනවා. ස්වර්ණමාලි දෙව් දුවත් සාධුකාර දෙනවා. දුටුගැමුණු මහරජතුමා බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා රාශියක් මහත් ගෞරවයෙන් යුතුව මහා සෑයේ නිධන් කළා."



"සාධු ! සාධු !! සාධු !!!
අමර හීනෙන් ම
සාධුකාර දුන්නා.

"මොකද පුතා?"
අම්මා ඇහුවා,
අමර වටපිට බැලුවා.
අමරට පුදුමයි !

"අම්මා රුවන්වැලි මහා සෑය
ළඟ දී කියූ දේවල් මම හීනෙන්
දැක්කා" අමර කිව්වා. අද අපි හැමෝ ම අනුරාධපුරයේ දී වඳිනුයේ පුදනුයේ එම රුවන්වැලි මහා සෑයටයි.

**"බොහෝ දෙනා බුදුරදුන් වෙනුවෙන් ඉදිකළ දාගැබ දැක සිත පහදවා ගෙන පින් රැස් කර ගතිති" බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම්

1. අමර සාධුකාර දුන්නේ කුමන අවස්ථාවේ දැයි ලියා දක්වන්න.
2. රුවන්වැලි මහා සෑයට වන්දනා කරන ගාථාව සොයා ගෙන පාඩම් කර ගන්න.

# 13. අම්මාට සැලකූ හොඳ පුතෙක්


ඉස්සර කාලයේ අපේ රටේ අග්බෝ නමින් දැහැමි බෞද්ධ රජ කෙනෙක් සිටියා. මේ රජතුමා සැම දා ම රාජ්‍ය සේවයට යන්නේ අම්මාට උපස්ථාන කිරීමෙන් පසුවයි.

රජතුමා උදෙන් ම අවදි වී තම මව නහවනවා. සුවපහසු අලුත් ඇඳුම් අන්දවනවා. සුවඳ තෙල් ගල්වා මනාව හිස පීරනවා. මවගේ කිලිටි රෙදි ඉතා ම කැමැත්තෙන් තමා ම සෝදනවා. මව සිටින කුටිය සුවඳවත් කරනවා.

සුවඳ තෙල් ගල්වා
දෙපා පිරිමදිනවා.
මවගේ නිදන ඇඳ
මනාව සකස් කොට
නිදි කරවනවා.



එසේ නිදි කරවා මවට පිටු නොපා
පසුපසට ගොස්
තුන්වරක් වැඳ
නමස්කාර කරනවා
"මගේ පුතාට
තෙරුවන් සරණයි"
යනුවෙන්
දිනපතා ම
රජතුමා මවගෙන්
ආශිර්වාද
ලබනවා.



අග්බෝ රජතුමා
මෙසේ පින්දහම් කරමින්
ධාර්මික ව රජකම් කළා.

ඒ දැහැමි රජතුමා මෙන් අපිත් අප හැදූ වැඩූ දෙමාපියන්ට සැලකීමට පුරුදු වෙමු.

**"මාපිය උපස්ථානය උතුම් මංගල කාරණයකි"**
**බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම්

1. අග්බෝ රජතුමා තම මවට සැලකූ ආකාරය ලියන්න.
2. ඔබත් දිනපතා මවට පියාට වැඳ පාසල් ඒම පුරුද්දක් කර ගන්න.

# 14. අසම්පදාන ජාතකය

විසූ රජගහ පුර
'මගධ' නම් වූ රජ පෙර
බබළවා පුරවර
රජ කළේ ගුණ දහමට ම බර

එකල සිටි ධනවත්
'සංඛ' සිටු හරි ගුණවත්
'පිළිය' සිටු සමගත්
ගොඩ නගා ගති මිතුරු දහමත්

කාලයක් ගතවිය
'පිළිය' සිටු දුප්පත් විය
පතා පිළිසරණය
'සංඛ' නම් සිටුතුමා හමුවිය

අසා හැම තොරතුරු
ගුණදම් වඩන නිරතුරු
සංඛ සිටු තෙම ගරු
පිදී තම සතු දනය මහරු



සියලු සම්පත් නම
පිරිහුණු සංඛ සිටුනෙම
සිහිකර මිතුරු දම
ගියා දුක් වී 'පිළිය' ළහටම



කුමට මෙහි ආවෙද
පිළිය සිටු නෙම ඇසූ සඳ
'ඔබෙන් පිහිටක් අද
නැතොත් මාහට කාගෙ පිහිටද'

බොල් වී ටිකක් ගෙන
සංඛ සිටුහට දෙන මෙන
මෙහෙකරුට දී අණ
'පිළිය' අමතක කළා කළගුණ

පෙර සංඛ සිටුගෙන්
හැමට ම උදවු ලැබුණෙන්
එම අයෙකු විගසින්
රජුට මේ පිළිබඳ ව කීවෙන්

කැඳවා සිටු දෙදෙන
රජු ම තතු විමසූ තැන
හතළිස් කෙළක් දන
'පිළිය' ගත් බව රජුට සැළවිණ



කෝප වූ රජ තෙම
පිළිය සතු මුළු දනයම
සංඛ සිටු හට මෙම
දිය යුතුයි' අණ කළේ විගසම



"කළගුණ නොසලකා
වැඩ කෙරුම නම් නරකා"
බුදු වදන සලකා
ඉන්න ඔබ කළගුණය සලකා

**"හොඳ යහළුවා බොරු කියා තමාගේ යහළුවන් රවටන්නේ නැත"**
**බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

පැවරුම්

1. ඔබ වඩා කැමති සංඛ සිටුවරයාට ද? පිළිය සිටුවරයාට ද? එයට හේතුව ලියන්න.
2. මෙම කවි පෙළ ගායනා කරන්න.

# 15. ශ්‍රී පාදස්ථානය



යන්නම්මදාය නදියා – පුලිනේවතීරේ
යංසච්ච බද්ධ ගිරිකේ – සුමනාචලග්ගේ
යංතත්ථ යෝනකපුරේ – මුනිනෝවපාදං
තංපාදලාංඡනමහං – සිරසානමාමි

අපේ බුදුහාමුදුරුවෝ ලක්දිවට තුන් වරක් වැඩම කර තිබෙනවා. පළමු වර මහියංගනයටත්, දෙවන වර නාගදීපයටත්, තෙවන වර කැලණියටත් වැඩම කළා.

මේ කාලයේ සමනළ කන්ද පවතින ප්‍රදේශයේ සුමන නම් පාලකයෙක් සිටියා. සමනළ කන්ද ප්‍රදේශයට අධිපති නිසා "සුමන සමන්" නමින් මොහු හඳුන්වනවා. සුමන සමන් දෙවියන් වශයෙන් හඳුන්වන්නේ මෙතුමායි.

සුමන සමන් දෙවියෝ බුදුහාමුදුරුවන් හමු වීමට මහියංගනයටත් කැලණියටත් ගියා. උන්වහන්සේගෙන් බණ ඇසුවා. තෙරුවන් සරණ ගියා. සෝවාන් බවට ද පත් වුණා.

සුමන සමන් දෙවියෝ කැලණියේ දී බුදුහාමුදුරුවන්ට සමනළ කන්දට වඩින ලෙස ආරාධනාවක් කළා. එම ආරාධනාව පිළිගත් බුදුහාමුදුරුවෝ පන්සියයක් රහතන් වහන්සේලා ද සමඟ සමනළ කන්දට වැඩම කළා. බුදුහාමුදුරුවෝ සමනළ කන්ද මුදුනේ තම වම් සිරිපතුල තැබුවා. මඟුල් ලකුණු සහිත සිරිපතුල් ලකුණ එහි පිහිටියා.

එතැන් සිට සමනළ කන්ද "ශ්‍රී පාදස්ථානය" නමින් හඳුන්වනවා. මෙරට රජ කළ බොහෝ රජවරු ශ්‍රී පාද පද්මය වැඳීමට සමනළ කන්දට ගියා. පුදපූජා පැවැත්වූවා. බොහෝ පින් සිදු කර ගත්තා. අද දක්වා බොහෝ දෙනා සමනළ කන්දට ගොස් ශ්‍රී පාද පද්මය වැඳ පින් සිදු කර ගන්නවා.

හැම දෙනා ම මෙම වන්දනා ගමන යන්නේ හරි ම කරුණාවෙන්, හරි ම ශ්‍රද්ධාවෙන්. හැමෝම සීත ගඟුල, ඉඳිකටුපාන, හැරමිටිපාන, මහගිරිදඹය, අහස්ගව්ව, පසුකර සමනළ කන්දට නගින්නේ තුන්සරණේ කවි කියමින්. එම හඬ ඇසෙන විට අපේ සිතට දැනෙන්නේ හරි ම සතුටක්.

බුද්ධං සරණේ සිරස දරා ගෙන
ධම්මං සරණේ සිත පහදා ගෙන
සංඝං සරණේ සිවුරු දරා ගෙන
එක්සැයි තුන්සරණේ අදහා ගෙන

පැවරුම්

1. ශ්‍රී පාදස්ථානය වන්දනා කරන ගාථාව ද දිනපතා වන්දනාවට එක් කර ගන්න.

## ජත්ත මානවක ගාථා

යෝ වදතං පවරෝ මනුජේසු
සක්‍යමුනී භගවා කතකිච්චෝ
පාරගතෝ බල විරිය සමංගී
තං සුගතං සරණත්ථමුපේමි

රාගවිරාගමනේජ මසෝකං
ධම්මමසඞ්ඛතමප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං
ධම්මමිමං සරණත්ථමුපේමි

යත්ථ ච දින්න මහප්ඵල මාහු
චතූසු සුචීසු පුරිස යුගේසු
අට්ඨ ච පුග්ගල ධම්ම දසා තෙ
සඞ්ඝමිමං සරණත්ථමුපේමි